(31)

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තිය සේවා ගණය (භාෂා අධිකාරී තනතුර) සඳහා වන උසස් කිරීමේ පටිපාටිය

**01. සම්බන්ධ වන ආයතනය**

1.1 දෙපාර්තමේන්තුව : රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
යොමු අංකය : DOL/AD/02/01/08 දිනය : 2018.08.03

1.2 අමාත්‍යාංශය : ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය
යොමු අංකය : MNCDOL/AD/11/DOL/02 දිනය : 2018.09.17
අමාත්‍යාංශය : රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
යොමු අංකය : MPA/ADM/EST/GA19/DEP.LAN දිනය : 2021.03.30
අමාත්‍යාංශය : රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
යොමු අංකය : MPA/ADM/EST/GA19/DEP.LAN දිනය : 2022.06.02
අමාත්‍යාංශය : අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
යොමු අංකය : M07/E27/DOL/07c දිනය : 2026.03.26

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/1137 දිනය: 2015.10.29
යොමු අංකය : DMS/1137/Vol.III දිනය: 2019.02.15
යොමු අංකය : DMS/1137/Vol.III දිනය: 2020.05.18

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : EST-2/RECRU/02/0514 දිනය: 2018.07.09

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : NSCC/07/45/28/SR දිනය: 2018.04.04
යොමු අංකය : NSCC/07/45/28/SR-I දිනය: 2019.03.15

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය : PSC/EST/03-01-29/03/2018 දිනය: 2022.10.20

**02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර අධිපන්තිය
3.2 ශ්‍රේණි : අධි ශ්‍රේණිය
3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය:

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක / සුසාධ්‍යකාරක / උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය / පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.



rd

CamScanner

51-1

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN -7 - 2016
5.2 මාසික වැටුප් පරිමාණය : 41580- 11 x 755 – 18 x 1030 - 68425/-
5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය රු. |
|---|---|---|
| අධි ශ්‍රේණිය | පියවර 1 | 41,580 |

06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| භාෂා අධිකාරි | අධි ශ්‍රේණිය | 08 | 1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා පහසුකම් සැලසීමට අදාළ කාර්යයන් .<br>- භාෂා පර්යේෂණ කටයුතු සිදු කිරීම, ඒ සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය.<br>- භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීම හා සම්බන්ධීකරණය කිරීම.<br>- පදමාලා සම්පාදනය කිරීම.<br>- භාෂා ඉගෙනීම සම්බන්ධ පෙළ පොත් හා ආධාරක ග්‍රන්ථ සම්පාදනය කිරීම.<br>- ශබ්ද කෝෂ සම්පාදනය කිරීම, ඒ සඳහා පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය.<br>- භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>- රාජ්‍ය භාෂා ප්‍රවීණතාවයට අදාළ විෂය නිර්දේශ සම්පාදනය කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 08



09

Ꚗ1 - II

07. බඳවාගැනීමේ ක්‍රමය

7.1 බඳවාගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.2 විවෘත බඳවාගැනීම : අදාළ නොවේ

7.3 සීමිත බඳවා ගැනීම.

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : අධි ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

හා

II. මව්බස සඳහා අ.පො.ස (සා.පෙළ)සිංහල/ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

හා

III. ඉංග්‍රීසි භාෂාව සඳහා අ.පො.ස (සා.පෙළ) සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස (උ.පෙළ) සාමාන්‍ය සාමාර්ථයක් හෝ පිළිගත් රාජ්‍ය හෝ රාජ්‍ය අනුබද්ධිත ආයතනයකින් එක් අවුරුද්දකට නොඅඩු ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

7.3.2.2 වෘත්තිය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද : රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත භාෂා පරිවර්තක තනතුරෙහි වසර 5ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ අයෙකු වීම.

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් : I. තනතුරෙහි ස්ථිර කර තිබීම.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.



nd

CamScanner

51 - III

7.3.3 වයස : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය : (අදාළ විෂය නිර්දේශය ඇමුණුම 01 හි දක්වා ඇත)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ නීතිය හා ක්‍රියාත්මක කරවීම. | 100 | 40 |
| විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය | 100 | 40 |
| සිංහල / දෙමළ මව් භාෂාව | 100 | 40 |
| ඉංග්‍රීසි භාෂාව | 100 | 40 |

7.3.4.1.1 විභාගය පවත්වන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ. |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| 3. අතිරේක පළපුරුද්ද | 35 | |
| 4. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 15 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |



nd

CamScanner

51 - IV

සටහන: I. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් ලිඛිත විභාගයේ හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

II. බඳවාගැනීම සිදුකරන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

III. විස්තරාත්මක ලකුණු පටිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ප්‍රසිද්ධ කරනු ලැබේ.

IV. ලිඛිත පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව, පුරප්පාඩු ප්‍රමාණය මෙන් පස් (5) ගුණයක් නොඅඩු සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

---

7.3.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන නිලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර දැන්වීම් පළ කිරීම මගින් හා වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවාගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම : අදාළ නොවේ

09. භාෂා ප්‍රවීණතාවය : අදාළ නොවේ

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :"සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

51 - V

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවාගැනීමේ පටිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් , රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර් කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කළේ : අත්සන : [signature]
(විෂය භාර [illegible] නිලධාරියා)
නම : සහකාර කොමසාරිස්
තනතුර : රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 341/7, කෝට්ටේ පාර, රාජගිරිය.
දිනය : 2026 . 02 . 25

පරීක්ෂා කළේ : අත්සන : [signature]
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ඩී. ඩී. එස්. එම්. [illegible]වීර
තනතුර: රාජ්‍ය භාෂා කො[illegible] රාජ්‍ය භාෂා දෙ[illegible]මේන්තුව 341/7, කෝට්ටේ පාර, රාජගිරිය.
දිනය : 2026 . 02 . 27

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
නම :
තනතුර: තිලක් නන්දන හෙට්ටිආරච්චි
නිල මුද්‍රාව: රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 341/7, කෝට්ටේ පාර රාජගිරිය.

දිනය : 2026 . 02 . 27

18. අමාත්‍යාංශ නිර්දේශය

යොමු අංකය : MOJ/E27/DOL/07

2022.10.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තිය සේවා ශ්‍රේණියේ භාෂා අධිකාරී තනතුර සඳහා වන උසස්කිරීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : [signature]
නම:
ලේකම්:
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
නිලමුද්‍රාව : ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන ලේකම් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

දිනය : 24/03/2026



CamScanner

51 - VI

19. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය PSC/ES1/03-01-29/03/2018

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර අධිපන්තිය සේවා ගණයේ භාෂා අධිකාරී තනතුර සඳහා වන මෙම උසස් කිරීමේ පටිපාටිය 2022.10.20 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : Mday

නම: ඩබ්ලිව් . එච් . එම් . එෆ් . පී . කේ . දයාරත්න

ලේකම්:

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව :

දිනය : 2026. 5 7

ඩබ්ලිව් ...
රාජ්‍ය ... සභාව
අංක 1200/9, ... පාර,
...මුල්ල

51 - VII

ඇමුණුම 01

**1. විභාගයේ නම :** රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා අධිකාරී (දෙපාර්තමේන්තුගත) නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය

**2. විභාගය පිළිබඳ විස්තර :**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ නීතිය හා ක්‍රියාත්මක කරවීම. | පැය 02 | 100 | 40 |
| 2. විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය | පැය 02 | 100 | 40 |
| 3. සිංහල / දෙමළ භාෂාව | පැය 02 | 100 | 40 |
| 4. ඉංග්‍රීසි භාෂාව | පැය 02 | 100 | 40 |

**3. විභාගය පවත්වනු ලබන බලධරයා :** විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

**4. විභාගය පවත්වන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :** පවතින පුරප්පාඩු අනුව

**5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ නීතිය හා ක්‍රියාත්මක කරවීම. | • ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ විකාශනය.<br>• රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති විධාන.<br>• රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කාලීනව බලපවත්නා චක්‍රලේඛ, අණ පනත් පිළිබඳ අවබෝධය.<br>• ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික තත්ත්වය. |
| 2. විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය | • රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබන ආයතනික/ සහායක/ නෛතික/ කළමනාකරණ කටයුතු පිළිබඳ අධීක්ෂණ රාජකාරිවල දී ඇති වන ගැටලු නිරාකරණය කිරීම පිළිබඳව. |
| 3. සිංහල / දෙමළ භාෂාව | • රචනය, උක්ත අඛ්‍යාත සම්බන්ධය, ව්‍යාකරණ, රාජකාරී ලේඛන පිළියෙල කිරීම. (මව් බස පිළිබඳ අ.පො.ස. (උ.පෙ.) මට්ටමේ විභාගය) |
| 4. ඉංග්‍රීසි භාෂාව | • රචනය , ඉංග්‍රීසි මූලික ව්‍යාකරණ, රාජකාරී ලිපි ලේඛන පිළියෙල කිරීම, අ.පො.ස. (සා.පෙ.) මට්ටමේ විභාගය) |



CamScanner

51 - VII

සකස්කළේ : අත්සන :..........................

(විෂය භාර නිලධාරියා)

නම : එම්. කේ. සී. දර්ශනී ඇල්විස්

තනතුර : සංවර්ධන නිලධාරී III

දිනය : 2026. 02. 23

පරීක්ෂා කළේ : අත්සන ..........................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ජී. එන්. ඒ. පෙරේරා,

තනතුර : පූ. කළ. සේවා / නිල (පරි.නි (වා.බ)

දිනය : 2026. 02. 23

පරිපාලන නිලධාරී (වා.බ.)
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

නිර්දේශකරඉදිරිපත්කරමි.

අත්සන:..........................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

---

නම :..........................

තනතුර: ..........................

නිල මුද්‍රාව:..........................

රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
7, කෝට්ටේ පාර
රාජගිරිය.

දිනය : 2026. 02. 27